ලිංගික අපරාධයක් වාර්තා කිරීමේදී තවමත් මාධ්‍ය තුළ "දූෂණය" "කෙළෙසීම" වැනි යෙදුම් භාවිතා කරන බව දක්නට ලැබේ. ශ්‍රී ලංකාවේ නීතියේ ද "දූෂණය" යන වචනය යෙදී තිබෙනු දක්නට ලැබේ.
"දූෂණය" හෝ "කෙළෙසීම" වැනි යෙදුම් භාවිතය තුළින්, ලිංගික අපරාධ සිදුවීමට මුහුණ පෑ අය (survivor) යම්කිසි ලෙසකට කිලිටි වී ඇති බවක්, අපවිත්‍ර වී ඇති බවක් හැඟවේ.

ලිංගික අපරාධයකට මුහුණ දුන් අයෙකුට නැවත සමාජය හා මුසු වීමට ඉඩක් තිබිය යුතුය. කෙසේ නමුත්, ලිංගික අපරාධයන් හා බැඳුනු සමාජ ගර්හාව හේතුවෙන්, ඔවුන්ගේ පුද්ගල ගරුත්වයට හානි පැමිණීමත්, ඔවුන් සමාජයේ කොන් කිරීමේ ආකල්පයකට ලක් වීමත් සිදුවිය හැක.

එසේ නම්,

1) "දූෂණය" "කෙළෙසීම" යන යෙදුම් වෙනුවට ලිංගික අපරාධය වැනි යෙදුමක් වඩාත් සුදුසු නොවේද?

2) නැති නම්, ඒ සඳහා ඔබ යෝජනා කරනා වෙනත් යෙදුම් තිබේද?